


# "නුහුරු රටේ තනි නොතනියට" හඬක්

## නිශාන්ත ජයකොඩි

**"නුහුරු රටේ
තනි නොතනියට"
"මියුරු" FM යන්නෙන් එදා සිඩ්නි
ශ්‍රාවකයන් අතර රස කලස බෙදා හදා
දුන් නිශාන්ත ජයකොඩි වෘත්තීයෙන්
ජ්‍යෙෂ්ඨ පරිගණක
මෘදුකාංග ඉංජිනේරුවරයෙකි.
සමාජ සත්කාරය මැනවින් දන්නා ප්‍රජා
සේවාවන්ට අතහිත දෙන්නෙකි.
ප්‍රසංගික කලාවේ නිවේදක කටයුතු වල
ප්‍රවීණත්වය ද රැකගනිමින් සිඩ්නි
බ්ලැක්ටවුන් සිංහල පාසලේ විදුහල්පති
ධූරය ද උසුලන්නෙකි.
විවිධ වූ මාධ්‍යයන්ට සම්බන්ධ සේම
රූපවාහිනී ටෙලි වෘත්තාන්ත සහාය
නිෂ්පාදකවරයෙකි. ඔහුගේ තොරතුරුත්
සමග අද ඔබ හා එක්වෙයි.**



විද්‍යුත් ලිපිනය
jayakodi@hotmail.com

**ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික ප්‍රජාව අතර ප්‍රවීන නිවේදකයෙකු ලෙස කටයුතු කරමින් දිගු ගමනක යෙදෙන ඔබ මේ සාර්ථකත්වයේ පසුබිම ගැන සඳහන් කලොත්**

මම මූලික අධ්‍යාපනය ලැබුවේ නාත්තන්ඩියේ දම්මිස්සර මධ්‍ය මහා විද්‍යාලයෙන්. පස්වැන්න ශිෂ්‍යත්වය සමත් උනායින් පස්සේ කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුලත් වෙනවා. දම්මිස්සර විදුහලේත්, ආනන්ද විදුහලෙත් අධ්‍යාපන කාලය තුල දිවයිනේ විවිධ කථික තරග වලින් පළමු, දෙවන හා තුන්වන ජයග්‍රහණ රාශියක් ලබාගත්තා.

ආනන්ද විද්‍යාලයට ඇතුළුවීමෙන් පසුව එහි විවාද කණ්ඩායමේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමත් සිදුවුනා. මේ ප්‍රගුණ කරගැනීම් අතරතුරේ මගේ හිත ඇතුලේ තිබ්බ හීනයක් තමා ගුවන් විදුලි සංස්ථාවට ගිහින් වැඩ සටහනකට සම්බන්ධ වෙන්නෙ කොහොමද කියන එක. මොකද දැන් වාගේ ගුවන් විදුලි වෙළඳ නාලිකා තිබ්බේ නෑනේ. එදා ගුවන් විදුලි මැදිරියකට පය තියන්නත් වාසනාව හැකියාව තියෙන්න ඕනේ.

**ඔබේ හීනේ සැබෑවෙනවා. පාසල් කාලයේදී ම ගුවන් විදුලියට සම්බන්ධවෙලා නිවේදක කටයුතු කරනවා. ඒක පළමු අත්දැකීම මට හිතෙන්නෙ.**

කොළඹ ආනන්දයේ මාගේ ක්‍රියාකාරකම් ඒ හීනෙට මට උදව්කලා. පාසල් ගමනේදී ම අනුමත කට හඬක් හැටියට, සහන නිවේදකයකු ලෙස වැඩ ගුවන් විදුලි සටහන් වලට සම්බන්ධ වුනා.

ගුරුවරුන් ගේ සහයෝගය විතරක් නොවෙයි ඒ දවස්වල ආනන්දයේ විදුහල්පති ව සිටි ගරු. කර්නල් වී.එස්. කුඩලිගම මහතාණන් ගේ අත්සනින් විශේෂ වූ ලිපියක් ද ලබා දී තිබුණා..මේ ළමයාට වැඩ සටහනට සහභාගීවන දිනවල දී වේලාසනින් පාසලින් බැහැර ව යන්නට ඉඩදෙන්නය..කියා. ඔය අවසර මැද කට්ටි පැනීම් ද නොතිබුනා නොවෙයි. හැමෝට ම පොදු දේනේ. ඒ කෙරුවට ඉතිං හානියක් නොවෙන විදිහට තමා කෙරුනේ. ස්වදේශීය සේවයේ වැඩ සටහන් දෙකක් කලා. ප්‍රචාරය වුනේ සති අන්තයේ.

**සමහර නාලිකාවල කතාකරන්නේ සිංහල ද ඉංග්‍රීසි ද කියලා හිතාගන්න බෑ. නමුත් අපි මේ රටේ සිංහල භාෂාව නියමිත විදිහට හසුරුවමින් කටයුතු කරනවා.**

**ඔබ කියනවා වාගේ පෞද්ගලික නාලිකා තිබුනේ නෑ ඒ කාලයේ. හොඳ ගීත, ගුණාත්මක වැඩ සටහන් තමා ප්‍රචාරය වුනේ. ඒ වගේම සුදුස්සාට නියමිත තැන, ශ්‍රේණිගත කිරීම්, භාෂාව නිවරදි ව උච්චාරණය කිරීම් සිදුවුනා. මම ඔබ හඳුවන්නේ තත්පරේට වචන හැටක් කතාකරන්නා කියලානේ, ඔබේ මුකරිකම, ඔය හැබෑ කතිකත්වය, මාධ්‍ය දැනුම නිසාම වන්නට ඇති ගුවන් විදුලි සංස්ථාවට එක්වන්නට වරප්‍රසාද ලැබුනේ.**

මම බොහෝ වෙලාවට හිතපු දෙයක් තමා ඕස්ට්‍රේලියාවට නොපැමිණියා නම් ගුවන් විදුලියේ යම් කාර්යභාරයක් කරන්නට ඉඩ තිබුණාය කියන එක. වැඩ සටහන් වලට සම්බන්ධ වන කාලයේ දී අපේ ආනන්දයේ සංගීතාංශය භාරව උන්නේ සංගීතඥ ලයනල් රංවල ගුරුතුමා. එතුමා නිර්මාණය කල ගැමි ජන ගී කණ්ඩායමට මට ද ගීත ගායනයෙන් එක්වන්නට අවසථාව ලැබුණා.

ඔය කාලෙදි ලේක් හවුස් භක්ති ගීත තරගයට අපේ කණ්ඩායම තරග වැදිලා ජයග්‍රහණය කලා. එතුමා යටතේ මා අවු 5 ක පමණ කාලයක් සංගීතය හැදෑරුවා. අපේ සිංහලකම, විතරක් ම නොවෙයි සිංහල හුරුව, ගැමි ජන ගී, සංස්කෘතිකාංග ඇඟට කාවැදුනා මෙවැනි ගුරුවරුන් යටතේ උගෙන ගත් දේවලින්.

ලයනල් රංවල ගුරුතුමාට පෙර උන්නේ ඩබ්.බී.මකුලොලුව මහත්මාණන්. එතුමා ලංකාවේ ජන සංගීතය පිළිබඳව පර්යේෂණ කරමින් සෑහෙන වැඩ කොටසක් කලා. රංවල ගුරුතුමාගේත් අදහස උනේ මකුලොලුව මහත්මාණන් ගේ මග යමින් ලංකාවේ ජන සංගීතයට සේවයක් කරන්නට. ආනන්දයෙන් ලැබූ ඒ ගුරු හරුකම් තමා මා මාධ්‍ය කටයුතු හා නිවේදක, සාමාජීය කටයුතු වලට නැඹුරු කලේ.

**නිවේදකයකු ගේ කාර්යභාරය අවසථානුරූපීව තැනට උචිත අයුරින් අසන්නාව සබඳකර ගැනීමත්, ඔවුනට යම් පණිවුඩයක්, රසාස්වාදයක් හා දැනුවත් කිරීමක් ගෙනදීමයි. ඔබ සිතන්නේ මේ කටයුත්ත සිදුවන්නේ කුමන ආකාරයටද**

සමහර සංවිධායකවරුන් නිවේදක කටයුතු වලදී නිවේදක-යාව යම් කිසි සීමාවකට කොටුකර ගනු ලබනවා. මෙතැන දී නිරායාසයෙන් ගලා එන කථනයේ අදහස් බොහෝ දුරට සීමාවෙනවා. නිවේදකයා ප්‍රේක්ෂකයාගේ ආකර්ෂණය ලබාගත යුතුයි. ලියාදුන් කරදාසි කැබැල්ලක් ඒ අයුරින් ම කියන්නටවේ නම් නිවේදකයා ගේ කාර්යභාරය නොවෙයි. එය ලබාදෙන්නා ගේ අමුම අමු වචන ප්‍රේක්ෂකයාට පිළිගැන්වීමක්. ප්‍රසංගයකදී නිවේදකයෙකු කරන්නේ නිර්මාණශීලී දායකත්වයක්. මම නොපැකිළිව කියන්න කැමතියි ගුවන් විදුලි සංස්ථාව ඇරුණා ම බොහෝ වෙළඳ නාලිකාවල කතා කරන ශිල්පීනට වඩා ඉදිරියෙන් අපේ මෙහේ ඉන්නා පිරිස් ඒ කටයුත්ත හරියට ම කරනවා. මොකද සමහර නාලිකාවල කතාකරන්නේ සිංහල ද ඉංග්‍රීසි ද කියලා හිතාගන්න බෑ. නමුත් අපි මේ රටේ සිංහල භාෂාව නියමිත විදිහට හසුරුවමින් කටයුතු කරනවා. ඒක මෙහේ ඉන්නා අනාගතය බාරගන්නා ඉන්න දරුවනටත් අත්වැළක්. ලංකාවේ 70-80 දශකවල සිටි දක්ෂ ශිල්පීන්ගේ අඩුව හොඳින් ම තේරෙනවා. ප්‍රමිතියක් නැති ගුවන් විදුලි කලාවක් නිසා බොහෝ හානි සිදුවෙමින් පවතිනවා.

**අසේල ජයනාත්, අජිත් ලක්ෂමන්, ඔබ හා මම මෙහි සිඩ්නි හි "මියුරු" ගුවන් විදුලි නාලිකාවේ වැඩ සටහන් කරගෙන යනු ලැබුවා. බොහෝ වෙලාවට නිශාන්ත සිංහල උගන්වන පාසැල් වලට ගොස් ලමුනගේ ක්‍රියාකාරකම් පටිගත කරගනිමින් වැඩ සටහන්ද කලා. ඒ දේවලට තිබුණ ඇල්ම අද ඊයේ නොවේ. ඔබ අද බ්ලැක්ටවුන් සිංහල පාසලේ විදුහල්පතිවරයා. නිසගයෙන් ගලා ආ හැඟීම් ඔබේ දැක්ම අද බොහෝ දුරට සාර්ථක වෙමින් පවතිනවා. එපමණක් ම නොවෙයි "මියුරු" ගුවන් විදුලි නාලිකාවේ අවු 5 කට අධික කාලයක් නිරත වෙමින් මහගු ප්‍රජා සත්කාරයක යෙදුනා. මේ ගුවන් විදුලි නාලිකාවේ ඔබට අමතක නොවන සිදුවීම් බොහොමයක් ම ඇති මට හිතෙන්නේ**

එවකට සිටි යුධ හාමුදාපති ජනරාල් සරත් ෆොන්සේකා මහතා සමග දීර්ඝතම සාකච්චාවක යෙදුනා. ඔහු මවු රටෙන් බැහැර දුන් දීර්ඝතම සම්මුක සාකච්චාව කලේ "මියුරු" ගුවන් විදුලි නාලිකාව බව කියන්නට පුළුවන්. මා අසන්නට උනේ ශ්‍රී ලංකා යුධ හාමුදාවට මානව හිමිකම් පිළිබඳව නැගෙන චෝදනා, යුද්ධයේ දී මියයන සාමාන්‍ය වැසියන් පිළිබඳ ව. ඉතාමත් සෘජු ලෙස ප්‍රශ්න කල මොහොතක් ඒක.

එදා මා අවසානයේ දි ඇසුවා "උතුරේ යුද්ධය ඔබ නැති කරනවා කියනවා...ඔබට පුළුවනිද මේ යුද්ධය නැති කරන්නට කියා. ඔහු පැවසුවේ " අපිට පුළුවනි යුද්ධය ...එල්.ටී.ටී ත්‍රස්තවාදය නැති කරන්නට නමුත් නැවත වරක් ත්‍රස්තවාදය ගොඩ නැගෙන ඒක මට නවත්තන්න බෑ..ඒක රටේ දේශපාලන නායකයන්ට බාරයි" කියන ප්‍රකාශය තමා කලේ. ඔහුත් රටේ නායකයනුත් ඉන්නේ ඔන්න ඔය වගේ තත්වයක කියලායි මට හැගෙන්නේ. අපි ලාංකිකයින් හැටියට රටට උපරිමය කරන්න පුළුවනි නම් ඒක තමා සුදුසුම දේ. මගේ මේ සාකච්චාව ශ්‍රී ලංකික ප්‍රජාවට ඉදිරිපත් කරන්නේ ද..නුහුරු රටක...නුහුරු බස් අතරට අපේ කම ස්ථාපිත කරන්නට වෙර දරන "සන්නස"පුවත් පත. ඉතින් විශේෂ වූ ස්තුතිය ඔවුනට ද පරිනැමිය යුතුයි.